# භූගෝලීය සාධක හා නගර බිහිවීම :
# මහනුවර පුරාණ නගරය බිහිවීම පිළිබඳ ඓතිහාසික භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයක්

**උමංගා රොෂාණි රම්මුංගොඩ[1] , ජයම්පත් සේනානායක**

දීර්ඝ කාලයක පටන් මිනිසා ස්වකීය පරිණාමීය ක්‍රියාවලිය තුළ පරිසරය හා ඉතා ශක්තිමත් සම්බන්ධතාවක් ගොඩනගමින් පැමිණ ඇත. එහිදී මිනිසා විසින් පරිණාමීය ක්‍රියාවලිය ඔස්සේ ක්‍රමයෙන් පරිසරයට අනුවර්තනය වීමේදී තමන්ට හා තම වර්ගයාගේ පැවැත්ම උදෙසා පවතින පරිසර සාධක තමන්ට අවශ්‍ය පරිදි වෙනස් කරගැනීමට උනන්දු විය.

පුරාණ සමාජයෙහි විසූ මිනිසුන් නගර බිහිකරගැනීමේදී ප්‍රධාන වශයෙන් සලකා බැලුයේ ආරක්‍ෂාවය. එය ක්‍රමයෙන් සමාජය විස්තෘත වීමේදී සමාජය වෙතින්ම ගොඩනැගි දේශපාලනමය සංකල්පයක් බවට පත්විය. ඒ අනුව සමාජයක දේශපාලන නායකත්වය සතු ප්‍රධාන වගකීමක් වූයේ ස්වකීය නගරය ආරක්ෂිත ස්ථානයක පිහිටුවා ගැනීමයි. පුරාතන ලෝකයේ මායා, ඇස්ටෙක් වැනි කඳුකර නාගරික සමාජ ද ස්වකීය නාගරික ජීවන පරිසරය ගොඩ නගා ගැනීම සඳහා ඉහළ කඳුකර භූමිය හා ඒ ආශ්‍රිත භූගෝලීය රටාවන් මනාව උපයෝගි කොටගෙන ඇත.

ශ්‍රී ලාංකේය ඓතිහාසික වංශකතාවන්හි හමුවන ඓතිහාසික නගර අතර මහනුවර පුරාණ නගරයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මලය දේශය, කන්දේ රාජ්‍යය, මහනුවර රාජධානිය, Candy, Candia, Kandy, යන නමින්ද හැදින්වූ මෙම නගරය වැදගත් වනුයේ නගරයක් වශයෙන් එය පිහිටුවා ගැනීමේදී ස්වභාවික පරිසරයෙන් දැක්වූ සහයෝගය හේතුවෙනි. අනෙකුත් රාජධානි සියල්ලම අභිබවා යමින් ස්වභාවික පරිසරයේ නිර්මිත භූගෝලීය ලක්‍ෂණ අනුව යමින් එයට අනුරූපව බිහිකරගත් මහනුවර නගරය ඒ හේතුවෙන් එයටම අනන්‍යවූ පරිසරයක් ගොඩනැඟුණු ආකාරයක් හඳුනාගත හැකිය. බැලූ බැල්මටම මහනුවර යනු කදුකර පරිසරයකට අයත් ප්‍රදේශයක් ලෙස ගිණිය

---

[1] පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
Email: umaroshani@gmail.com

හැකි වුවද, මෙහිලා විශේෂ වන්නේ එම කඳුකර පරිසරය හා ඒ ආශ්‍රිත භූගෝලීය පිහිටීම නිසියාකාරව කළමනාකරණය කර ගත්තේ කෙසේද යන්න තේරුම් ගැනීමය.

මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි මූලික අරමුණ වන්නේ සියවස් ගණනාවක පටන් පැවතෙන ඓතිහාසික මහනුවර රාජධානිය බිහිවීම සඳහා ඒ ආශ්‍රිත භූගෝලීය සාධක බලපා ඇත්තේ කෙසේද යන්න හඳුනා ගැනීමයි. එහිදී විශේෂයෙන් ඒ සඳහා බලපෑ භූගෝලීය සාධක කවරේ ද? ඒවා නිසි පරිදි කළමනාකරණය කර ඇත්තේ කෙසේද? එමගින් අත්කරගත්තාවූ ප්‍රතිඵල කුමක්ද? යන්න පිළිබඳව වැඩි දුරටත් සාකච්ඡා කිරීමට නියමිතය.

ප්‍රමුඛ පද: මහනුවර, භූගෝලීය සාධක, කඳුකර නගර

**Title:** Geographical Factors and Origin of Cities: A Historical Geographical Study on the Origin of Old City of Kandy

**Keywords:** Mahanuwara, geographical factors, hill cities